සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

06 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 14 S I

**කතෝලික ධර්මය - I** | කාලය පැය එකයි

නම හා විභාග අංකය :

සැලකිය යුතුයි :- ● ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01. නව ගිවිසුමේ මුල්ම ශුභාරංචිය ලියූ ජේසුස් වහන්සේගේ අපෝස්තුළුවරයෙක් වන්නේ,
    01. ශු.මාක්තුමා 02. ශු.මතෙව්තුමා 03. ශු.ලූක්තුමා 04. ශු.ජොහාන් තුමා
02. විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම වනුයේ,
    01. ශු. බයිබලයයි 02. කතෝලික සභා ධර්මෝපදේශය 03. ආගමික පොත් 04. පංච පුස්තකය
03. දෙවියන් වහන්සේ ඉර හඳ හා තාරකා මවනු ලැබුවේ ........................ දිනදීය. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
    01. දෙවන 02. තෙවන 03. පළමු 04. සතරවන
04. දෙවියන් වහන්සේ තමන් මවා වදාළ සියලු දේ නරඹා එය ඉතා ........................ බව දුටු සේක. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
    01. ප්‍රයෝජන 02. අලංකාර 03. මනහර 04. නිර්මාණශීලි
05. ජේසුස් වහන්සේගේ උපත ගැන ප්‍රකාශ කළ දිවැසි වරයා,
    01. යෙසායා 02. මීකා 03. ජෙරමියා 04. එසකියෙල්
06. දෙවියන් වහන්සේ මිනිස් සංහතිය තුළ විවිධත්වයක් ඇතිවීමට සැලැසුවූයේ,
    01. දේව සැලැස්ම අනුව මැවිල්ලේ අගය වැඩි කිරීමට 02. එක් එක් ජන කොටස් සිටින බව දක්වීමට
    03. සියලු දෙනාම මිනිසුන් බව ඇඟවීමට 04. විවිධ මිනිස් කණ්ඩායම් ලෙස වෙන් කර තැබීමට
07. මරියතුමියගේ ඥාතිවරියකි. ස්නාවක ජුවාම් තුමාගේ මවය.
    01. මරිය මග්දලේනා 02. එළිසබෙත් තුමිය 03. මාර්තා තුමිය 04. ආනා මුනිවරිය
08. ජේසුන් වහන්සේ තමන් දේව පුත්‍රයා වුවද තම දෙමාපියන් ........................ විසූ සේක. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
    01. අවධානයෙන් 02. සහයෝගයෙන් 03. කීකරුව 04. බැගෑපත්ව
09. ස්වභාවික හා ආධ්‍යාත්මික ජීවිතයේ ජීවිත තත්වයන් තෝරා ගැනීම සඳහා ලැබෙන ප්‍රසාද නිධාන වන්නේ,
    01. ආශිර්වාදාකාර බන්ධනය හා පූජකවරය 03. සමඟි සන්දානය හා රෝගීන්ගේ ආලේපය
    02. ප්‍රසාද ස්නාපනය හා දිව්‍ය සත්ප්‍රසාදය 04. ආශිර්වාදකාර බන්ධනය හා දිව්‍ය සත්ප්‍රසාදය
10. ප්‍රසාද ස්නාපනයේදී ශුද්ධ වූ තෛලයන් ආලේප කිරීම සංකේතවත් කරනු ලබන්නේ,
    01. ක්‍රිස්තියානි ජීවිතයක් ලැබීම 02. දෙවියන් වහන්සේගේ දරුවෙකු වීම.
    03. ස්වර්ග රාජ්‍ය හිමිවීම. 04. ශුද්ධාත්ම වරම් ලැබීම.
11. ජීවිත පෝෂණය වීමට හා වරප්‍රසාදයෙන් පූර්ණව වර්ධනය වීමට හැකි සෑම විටම ලැබිය යුතු ප්‍රසාද නිධානය වන්නේ,
    01. රෝගීන්ගේ ආලේපය 02. සමගි සන්දානය 03. දිව්‍ය සත් ප්‍රසාදය 04. අභිවෘද්ධි ආලේපය
12. ආරම්භක ප්‍රසාද නිධානයක් නොවන්නේ,
    01. ආශිර්වාදකාර බන්ධනය 02. ප්‍රසාද ස්නාපනය 03. දිව්‍ය සත්ප්‍රසාදය 04. ආශිර්වාදකා බන්ධනය
13. පෙන්තකොස්ත දින ගෝලයන් වෙතට ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කළාක් මෙන් ........................ නැමැති ප්‍රසාද නිධානයෙන් උන් වහන්සේ අප වෙතට වැඩම කරන සේක. හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
    01. දිව්‍ය සත්ප්‍රසාදය 02. රෝගීන්ගේ ආලේපය 03. පූජකවරය 04. අභිවෘද්ධි ආලේපය
14. සෑම විටම සත්‍ය පමණක් ප්‍රකාශ කිරීමට අපට උගන්වන පනත වන්නේ,
    01. දසවන 02. පස්වන 03. අටවන 04. හත්වන

15. පරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍ය පවත්වනු ලබන්නේ,

01. ජනවාරි 01 02. අගෝස්තු 15 03. දෙසැම්බර් 08 04. දෙසැම්බර් 25

16. ''ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා .................. කරන්න." හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,

01. පීඩා 02. සමාව 03. යාච්ඤා 04. වෛර

17. ''පියාණෙනි, ඔවුන්ට කමා වුව මැනව, ඔහුන් කරන දෙය ඔවුහු නොදනිති'' යි. ප්‍රකාශ කරනු ලැබුවේ,

01. සකේවුස් 02. ජේසුස් වහන්සේ 03. ස්නාවක ජුවාම් තුමා 04. පරිසිවරු

18. තමා සිල්වත් යැයි සිතමින් අන් හැම දෙනා හෙළා දුටු අයට ජේසුස් වහන්සේ වදාළ උපමාව වන්නේ,

01. වපුරන්නාගේ උපමාව 02. පරිසිවරයා හා අයකැමියා

03. අධර්මිෂ්ඨ විනිශ්චයකාරයා 04. මැදියම් රැයේ පැමිණි මිත්‍රයා

19. අපෝස්තුළුවරුන්ගේ විශ්වාස ලක්ෂණයේ විශ්වාසයේ සත්‍යතා ගණන වන්නේ,

01. අටකි 02. හතකි 03. දොළසකි 04. නමයකි

20. පාපොච්චාරණ අවස්ථාවේදී පව් කමාව ලබා ගැනීමට ප්‍රථම උච්චාරණය කරන යාච්ඤාව වන්නේ,

01. පරමණ්ඩල යාච්ඤාව 02. දයාධික මනස්තාපය 03. විශ්වාස ලක්ෂණය 04. නමෝ මරිය

( ල. 2 x 10 = 20 )

## II කොටස

**පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. i. මිනිසා හා සිංහයා සංකේතවත් කරන ශුභාරංචි කතුවරු දෙදෙනාගේ නම් ලියන්න.
   ii. පංච පුස්තකයට අයත් පළමු පොත් දෙක නම් කරන්න.
   iii. ශුද්ධ බයිබලය බෙදෙන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
   iv. දෙවියන් වහන්සේ මවා දුන් ලෝකය තුළ මිනිසාට පැවරූ වගකීම් දෙකක් ලියන්න.
   v. ජේසුස් වහන්සේ කැප කිරීමට ජෙරුසලම් දේව මාළිගයට ගෙන යන විට ඔප්පු කළ පක්ෂීන් දෙදෙනකුගේ නම් ලියන්න.
   vi. පනත් දසයේ පළමු හා අවසාන පනත නම් කරන්න.
   vii. ප්‍රසාද ස්නාපනයේදී භාවිත කරන සංකේත 2 ක් නම් කරන්න.
   viii. රෝගීන්ගේ ආලේපය ලැබිය යුතු අවස්ථා 2 ක් ලියන්න.
   ix. ගොඩමස් කෑමෙන් වැළකීම හා එක්වරු ශීලය රැකීම ශුද්ධ වූ සභාව නියම කර ඇති දින 2 ක් ලියන්න.
   x. ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 2 ක් ලියන්න. ( ල. 2 x 10 = 20 )

02. i. මරියතුමිය වෙනුවෙන් කැපකර ඇති දේස්ථාන 2 ක් ලියන්න. ල. 2
   ii. මරියතුමියගේ මංගල්‍ය තුනක් නම් කරන්න. ල. 3
   iii. මරියතුමියට කියන ගීතිකාවක් ලියන්න ල. 5

03. i. දිනපතා කියනු ලබන යාච්ඤා දෙකක් නම් කරන්න. ල. 2
   ii. යාච්ඤා වර්ග තුනක් නම් කරන්න. ල. 3
   iii. ස්වාමිවාක් ආරාධනාවේ ලක්ෂණ 5 ක් ලියන්න. ල. 5

04. i. 4 වන පනතට විරුද්ධ පව් 2 ක් ලියන්න. ල. 2
   ii. 6, 7, 8 පනත් නම් කරන්න.(මහෝපදේශය 2:85) ල. 3
   iii. ඉරුදින අප නොකළ යුතු දේවල් කරුණු පහක් ලියන්න. ල. 5

05. i. අන්තිම රාත්‍රී භෝජන දවසේදී ජේසුස් වහන්සේ ස්ථාපිත කළ ප්‍රසාද නිධාන 2 ක් නම් කරන්න. ල. 2
   ii. පෙන්තකොස්ත දින ශුද්ධාත්මයාණන් වැඩම කරන විට සිදු වූ ගෝලයන් දුටු වෙනස්කම් 3 ක් ලියන්න. ල. 3
   iii. ප්‍රසාද ස්නාපනය ලැබූ දරුවෙකු ලෙස ගෙදරදී, පාසලේදී ඔබගේ ක්‍රිස්තියානි යුතුකම් පහක් ලියන්න. ල. 5

06. i. අසිරිමත් දේව මැවිල්ල සුරකිමු යන මාතෘකාවට වගන්ති 5 ක් ලියන්න. ල. 5
   ii. පරිසරයට හානි සිදුවන ආකාරය කරුණු 5 කින් ලියා දක්වන්න. ල. 5 ( ල. 5 x 2 = 10 )

# තෙවන වාර පරීක්ෂණය - 2019
# කතෝලික ධර්මය

06 ශ්‍රේණිය

# පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. 2 | 02. 1 | 03. 4 | 04. 3 | 5. 1 |
| 06. 1 | 07. 2 | 08. 3 | 09. 1 | 10. 4 |
| 11. 3 | 12. 1 | 13. 4 | 14. 3 | 15. 1 |
| 16. 1 | 17. 2 | 18. 2 | 19. 3 | 20. 2 |

## II කොටස

01. i. මතෙව්තුමා, මාක්තුමා
 ii. උත්පත්ති, නිකමයාම
 iii. පැරණි ගිවිසුම, නව ගිවිසුම
 iv. දරු සම්පත් ලැබීම, පොළොව පුරා පැතිර යාම, මාළුන් කුරුල්ලන් සියලු දෙනා පාලනය, රැක ගැනීම වර්ධනය කිරීම, වගා කිරීම.
 v. කොබෙයියන්, පරවියන්
 vi. සැබෑ වූ එකම දෙවියන්ට වන්දනා කිරීම.
 අන්වස්තු ආශා නොකරන්න.
 vii. ජලය, සුදු වස්ත්‍රය, පාස්කු ඉටි පහන, වෙනත් ඉටි පහන්, ශු.තෙලය
 viii. බරපතල ලෙස රෝගී වූ විට
 බරපතල ශෛල්‍ය කර්මයක් වූ විට
 වයස්ගතව දුර්වලව සිටින විට
 මරණාසන්නව සිටින විට
 බරපතල අසනීපයකදී
 ix. අළු බදාදා, මහ සිකුරාදා, අවුරුද්දේ සෑම සිකුරාදා
 x. ජේසුස් වහන්සේගේ බෞතීස්මයේදී, සුවය දානය කිරීමට, පේදුරුතුමාගේ මහා ප්‍රකාශයට පෙර, අන්‍යරූප විලාශවීමට පෙර, ස්වාමීමාක් ආරාධනාව ඉගැන්වීමට පෙර, කුරුස ගසේදී ( ල. 2 x 10 = 20 )

02. i. ලංකාවේ අප ස්වාමි දූ
 සදාසරණ මෑණියන්
 මාතර අප ස්වාමි දූ
 මරද මඩු මෑණියන්
 ii. අති පාරිශුද්ධ දේව මාතාවන්ගේ මංගල්‍යය
 දේව මාතාවන් පරලොවට වැඩිය මංගල්‍යය
 දේව මාතාවන් ජන්ම දෝෂයෙන් නිර්දොශව පිළිසිඳීමේ මංගල්‍යය
 iii. පිළිතුර ගැළපේ නම් ලකුණු ලබා දෙන්න. (ල. 2 + 3 + 5 = 10 )

03. i. පරමණ්ඩල යාච්ඤාව, නමෝ මරිය යාච්ඤාව, විශ්වාස ලක්ෂණය
 ii. ප්‍රශංසාව, තුති පිදීම, කමාව අයැදීම, වරප්‍රසාද ඉල්ලා ගැනීම.
 iii. දේව ප්‍රශංසාව, දේව නමස්කාරය, ඉල්ලීම, සමාව යැදීම, දේව ආරක්ෂාවට නතු වීම. (ල. 2 + 3 + 5 = 10 )

04. i. මවට පියාට ගරු නොකිරීම, අකීකරු වීම, ගෞරවයක් නැති කතාව, සියලු දේ නාස්ති කිරීම, වැනි දෙමාපියන්ට විරුද්ධව කරන වැරදි
 ii. කාම මිථ්‍යාචාරය නොකරව, සොරකම් නොකරව, බොරු නොකියව
 iii. දිව්‍ය පූජාව අතපසු කිරීම, වැඩිපුර මුදල් ඉපයීමේ කටයුතු නොකිරීම, අසංවර විලාසිතා වලින් දේවස්ථානයට නොපැමිණීම, දේවස්ථානය තුළ විහිලු තහලු කිරීම , ජංගම දුරකථන භාවිතයෙන් කතා කිරීම වැනි දේ වලින් වැළකීම (ල. 2 + 3 + 5 = 10 )

05. i. පූජාත්වය, දිව්‍ය සත්ප්‍රසාදය
 ii. සැඩ සුළඟ, ගිනි දළු වැනි දිව්, අන්‍ය භාෂා කතා කිරීම, නිර්භීත හැසිරීම
 iii. ගැළපෙන පිළිතුරු ඇත්නම් ලකුණු ලබා දෙන්න (ල. 2 + 3 + 5 = 10 )

06. ගැළපෙන ලෙස වගන්ති පෙලගස්වා ඇත්නම් ලකුණු ලබා දෙන්න.